කිරම ධම්මාරාම තෙරුන්නාන්සේ

විසින්

රචනා කරණ ලද

# විබත් මල්දම

සිංහල ව්‍යාකරණ ඉගෙණගන්නා

අධුනිකයින්ට ඉතා ප්‍රයෝජනවත්

මේ පොත

ගම්පල පදිංචි

දොන් සයිමොන් පෙරේරා අප්පුහාමි

විසින්

සමර්ථ සද්වීර කෙනෙක් ලවා

සකස් කරවා

කොළඹ

ශාස්ත්‍රාලෝක යන්ත්‍ර ශාලාවෙහි

අච්චු ගස්වන ලදී.

බුද්ධවර්ෂ 2426.

ක්‍රිස්තුවර්ෂ 1883.

# VIBAT MALDAMA.

BY

REVD KIRAMA DHAMMARAMa

This useful book for beginners of Sinhalese Grammar was paraphrased by a learned Budhist Priest and published

BY

Don Simon Perera of Gampola


Printed at the

Sastraloka Printing Press

Colombo.

1883.


B. S.


ශ්‍රී ලංකා ජාතික පුස්තකාලය

# දැන්වීමයි.

සිංහල ව්‍යාකරණ ඉගෙණගන්නා ආධුනිකයින්ට ඉතා ප්‍රයොජනවත්වූ විබත්මල්දම නම් මේ පොත කිරම බම්මාරාම තෙරුන්නාන්සේ විසින් රචනා කරණලද්දකි—මෙහි නාම විභක්ති පදමාලාවද, ක්‍රියා විභක්ති පදමාලාවද යහපත්කොට ප්‍රයොජන වන පරිද්දෙන් යොදා තිබෙන හෙයින් අනුවර්ථනාම වසයෙන් "**විබත් මල්දම**" නම් යයි දතයුතු, මෙහි සන්නයද පණ්ඩිත අපණ්ඩිත සියළුදෙනාටම සුවසේ හැගෙනාකාරයෙන් යොජනාකර තිබේ.

**D. S.**

---

# ශුද්ධ පත්‍රය.

| පි. | පෙළේ. | අශුද්ධ. | ශුද්ධ. |
|---|---|---|---|
| 1 | 25 | ඇතුල් | ඇතුල් |
| 2 | 2 | රැපුත් | රැපුත් |
| 2 | 4 | බමණුහු | බමුණුහු |
| 2 | 6 | විපත් | විබත් |
| 2 | 27 | සඳු | සදෘ |
| 3 | 8 | මොණරුන | මොනරුන |
| 4 | 4 | නරුනකල | නරුනකළු |
| 4 | 13 | ශුඛයසි | ශුඛසි |
| 4 | 16 | මහාග්‍රන්ථය | මහාග්‍රන්ථයන් |
| 4 | 24 | එකාබසදෘ | එකාසබදෘ |

| පි. | පෙළේ. | අසුඩ. | සුඩ. |
| --- | --- | --- | --- |
| 5 | 2 | මුණ් | මුනි—මුණ් |
| 6 | 4 | දිගුදල | දිගුදළ |
| 9 | 14 | සැඩරැස්හුගෙන් | සැඩරැස්හුගෙන් |
| 9 | 14 | සැඩරුස්නගෙන් | සැඩරැස්නගෙන් |
| 11 | 18 | මරුවෝ | මරුවෝ |
| 12 | 19 | පිළිවෙල | පිළිවෙළ |
| 15 | 5 | පෙරතො | පෙරතෝ |
| 17 | 25 | දිව්‍යයැප | දිව්‍යසැප |
| 18 | 1 | කාළමො | කාළමෝ |
| 18 | 18 | කුසල | කුසල් |
| 20 | 20 | චිරාකාලයක් | චිරාත්කාලයක් |
| 20 | 23 | දෙත්තේ | දෙසත්තේ |
| 20 | 26 | යහසතක් | යහපතක් |
| 21 | 2 | දිනේවා | දිලේවා |
| 21 | 8 | ගෙසින්ලා | ගොසින්ලා |
| 21 | 29 | පණ්ඩිතයන් | පණ්ඩිතයන් |
| 22 | 21 | මිලියෙම්නී | මිලියෙම්නි |
| 22 | 26 | මහාරජ මහරජ | මහරජ |
| 22 | 27 | අමතිලවා | ඇමතිලවා |
| 23 | 4 | යශුකරවා | යශෘකරවා |

මේ ☞( )ලකුණතුල තිබෙන වාසගම් කෑලල 16 වෙනි පිටේ 7 වෙනි පෙළේ තුබූ වෙශි කී තැනට ගත යුතුයි.

(බුහු බස නම්-දැන් තොපි පින් කරන්නවකරව්, දැන් තොපි බත් පිසන්නව පිසව්, දැන්තොපි මැරෙන්නව මැරෙව්, දැන්තොපි තුටුවන්නව තුටුවව්.)

D. Johannis Peiris.

R.A.S.

# නමච් මුණිසරණ.

නැමද අප දියබප් නෙකදනට වැඩ සඳහා
පොරනැදුරුබස්ගෙණ කරනෙම්විබත්මල්දම්.

පෙරවිබත්, අලප්විබත්, කම්විබත්, කතුවිබත්, කරණවිබත්, සපදත්විබත්, අවදිවිබත්, සබදවිබත්, අදරවිබත්, යන සත්විබත් පිළිවෙළින් පවසම්—එහි පෙරවිබත් එකබසනම්.

---

අපදියබප්, අපගේ ජගත් පිතෘවූ;(සර්වඥයා) නැමද, නමස්කාරකොට; නෙකදනට, අනෙකජනයාගේ; වැඩසඳහා, අභිවෘද්ධිය පිණිස; පොරණැදුරු, පුරාණාචාර්ය්‍යවරයන්ගේ; බස්ගෙණ, වචනග්‍රහණයකොට; විබත්මල්දම්, විභක්ති මාලාදාමනම් (ප්‍රකරණයක්;) කරනෙම්, කරනෙනම්—

පෙරවිබත්, ප්‍රථමාවිභක්තිය; අලප්විබත්, ආලපනවිභක්තිය; කම්විබත්, කර්‍ම විභක්තිය; කතුවිබත්, කර්‍තෘවිභක්තිය; කරණවිබත්, කරණවිභක්තිය; සපදත්විබත්, සම්ප්‍රදානවිභක්තිය; අවදිවිබත්, අවධිවිභක්තිය; සබදවිබත්, සම්බන්ධවිභක්තිය; අදරවිබත්, ආධාරවිභක්තිය; යන, කියන; සත්විබත්, * සප්තවිභක්තීන් පිළිවෙළින්; පටිපාටියෙන්; පවසම්, ප්‍රකාශකරමි.—

එහි, ඒ සප්තවිභක්තීන් අතුරෙහි; පෙරවිබත්එකබස නම්, ප්‍රථමාවිභක්ති එකවචනයනම්—

---

* මෙහි සප්තවිභක්තියයි කීවේ ආලපනය ප්‍රථමාවටද කරණය කර්‍තෘවිභක්තියටද ඇතුල්හෙයිනි.

1 මුණිඳේ දම්දෙසෙ, දිනිඳු අඳුරු වැනසී, මැතිඳු නඩුඅසා, නිරිඳෙක් රුපුන් ජයගනී,— බුහුබස නම්—දෙවියෝ අසිරිදෙත්, අසුරෝ හරුම පරදිත්, බමණුහු මතුරු උගණිත්, පඬු වෝදොසක් නොකරත්.

2 පෙරවිබතටම ඇතුලත් අලප්විපත් එකබස් නම්—මහරදලෙව් නොනස, පුතැසව්සත උගණුව, සඳැමන කොඳපොබ, මැතිඳේ දුසිරි නොකරව.

---

1 මුණිඳේ, සර්‍වඥතෙම; දම්, ධර්‍මය, දෙසේ, දෙශනාකෙළේය; දිනිඳු, දිනේන්‍ද්‍රතෙමේ; අඳුරු, අන්‍ධකාරය; වැනසී, විනාසකෙළේය; මැතිඳු, අමාත්‍යවරතෙමේ; නඩු, අධිකරණයන්; අසා, අසයි; නිරිඳෙක්, නරෙන්ද්‍රයෙක්; රුපුන්, සතුරන්; ජයගනී, ජයගන්නේය; බුහුබසනම්, බහුවචනයනම්; දෙවියෝ, දේවතාවෝ; අසිරිදෙත්; ආශිර්‍වාද දානයකෙරෙත්; අසුරෝ, දානවයෝ; හරුම, විෂ්ණුම; පරදීත්, පරාජයවෙත්; බමුණුහු, බ්‍රාහ්මනයෝ; මතුරු, මන්ත්‍ර; උගණීත්, උද්ග්‍රහණය කරත්; පඬුවෝ, පණ්ඩිතයෝ; දොසක්, දොෂයක්; නොකරත්, නොකරති.

2 පෙරවිබතටම, ප්‍රථමාවිභක්තියටම; ඇතුලත්, අන්තර්ගතවූ; අලප්විබත් එකබසනම්, ආලපන විභක්තිඑකවචනයනම්; මහරද, මහාරාජය; ලෙව්, ලෝකසත්‍වයා; නොනස, විනාසනොකරව; පුතැ, පුත්‍රය; සව්සත, සියලුශාස්ත්‍රය; උගනුව, උද්ග්‍රහණයකරව; සඳු, චන්ද්‍රය; මනකොඳ, මනස්කෞමදයන්; පොබ, ප්‍රබොධකරව; මැතිඳේ, මන්ත්‍රීන්ද්‍රය; දුසිරිනොකරව, දුශ්චරිතය නොකරව.

බුහුබසනම්—කිවිති ගත් උගණිව්, මිතුරෙනි නොමඳ සෙත දෙව්, සත්නෙනි පින්කරව් සිත්නිඅවැඩක් නොසිතව්.

3 කම්විබත් එකබසනම්-මුණිසඳ නමකරව, සත්විඳු යෙහෙන් උගනුව, මැතිඳු බලාඑව, මරඟුදිනා පින්බලයෙන්.

බුහුබසනම්—මහණුන් නමදනේ, පිළිමල් නනිති ජයගනු, මොණරනනරඹන්නා, රුක් නට නැගෙත් වඳුරෝ.

---

බුහුබසනම්, බහුවචනයනම්; කිවිති, කවිවරුනි; ගත්, ග්‍රන්ථයන්; උගණිව්, උද්ග්‍රහණය කරව්; මිතුරෙනි, මිත්‍රවරුනි; නොමඳ, බොහෝවූ; සෙත, ශාන්තිය; දෙව්, දානය කරව්; සත්නෙනි, සත්පුරුෂයෙනි; පින්කරව්, කුසල්කරව්; සිත්නි, චිත්තයෙනි; අවැඩක්, අනභිවෘද්ධියක්; නොසිතව්, චින්තනය නොකරව්.

3 කම්විබත් එකබසනම්, කර්මවිභක්ති එකවචනයනම්; මුණිසඳ, මුනීන්ද්‍රයා; නමකරව, නමස්කාරකරව; සත්විඳු, යහපත් විද්‍යාවන්; යෙහෙන්, යහපත් පරිද්දෙන්; උගනුව, උද්ග්‍රහණය කරව; මැතිඳු, මන්ත්‍රීන්ද්‍රයා, බලා, නරඹා; එව, ආගමණය කරව; මරඟු, මාරයා; පින්බලයෙන්, පුණ්‍යශක්තියෙන්; දිනා, ජයගනුව; බුහුබසනම්, බහුවචනයනාම්; මහණුන්, ශ්‍රමණයන්; නමදනේ, නමස්කාර කරන්නේය; ළිපිමල්න, ප්‍රතිමල්ලයන්; (පොරට එන්නන්) නිතිජයගනු, නිරන්තරයෙන් ජයග්‍රහණය කරව්; මොණරන, මයූරයන්; නරඹන්න, බලන්න; රුක්නට, වෘක්ෂයන්ට; වඳුරෝ, වානරයෝ; නැගෙත්, ආරූඪවෙත්.

4 කතුවිබත් එකබසනම්, රම්රදගත් දසවෙස්
නිරිඳුකළ තදසුද, සිරදෘනැසූ ගජකැල, රුසි
හුවදගළ මහගත්, බුහුබසනම්, බිලිඳුන් කළ
නැටුම්, මීපල්නගත් මඩලග, නරනකල දුසි
රි, කිවින් පදකළ කව්පද.

5 මෙම කතුවිබතටම ඇතුලත් කරණවිබත්
එකබසද බුහුබසද, එකලෙසමයි, යසින් ලො
වැ පළවේ, ගුණෙන් සව්සත සිත්ගනු, මෙත්
නෙත් වෙරනසනු, සිත්නි ගැමදෙය විමසනු.

---

4 කතුවිබත් එකබසනම්, කර්තෘවිභක්ති එකවච
නයනම්; රම්රදු, රාමරජයා විසින්; ගත්, ගණ්ණා
ලද; දසවෙස්, දශවිධවෙශයයි; නිරිඳු, නරෙන්‍ද්‍රයා
විසින්; කළ, කරණලද; තදසුද, දැඩිවූයුධයයි; සී
රදෘ, සිංහරාජයා විසින්; ගජකැල, හස්තිසමූහයා;
නැසූ, නසනලදී; රුසිහු, සෘෂිහුවිසින්; මහගත්,
මහාග්‍රන්ථය, වදහළ, වදාරණලදී; බුහුබසනම්, බ
හුවචනයනම්, බිලිඳුන්, ළදරුවන් විසින්; කළ,
කරණලද; නැටුම්, නෘත්‍යයි; මීපල්න, මහීපාලයන්
විසින්; ගත්, ගණ්ණාලද; මඩලග, මණ්ඩලාග්‍රයි
(කඩු) නරන, මනුෂ්‍යයන් විසින්; කල, කරණලද;
දුසිරි, දුශ්චරිතයි; කිවින්, කවීන්විසින්; පදකළ, ප්‍ර
බන්ධකරණලද; කව්පද, කාව්‍යපදයි.

5 මෙම කතුවිබතටම, මේ කර්තෘවිභක්තියටම;
ඇතුලත්, අනතර්ගතවූ; කරණවිබත් එකබසද;
කරණවිභක්ති එකවචනයද; බුහුබසද, බහුවචන
යද; එකලෙසමයි, ඒකාකාරමයි; යසින්, යශස් කර
ණකොටගෙණ; ලොවැ, ලොකයෙහි; පළවේ, ප්‍ර
කාශවේ; ගුණෙන්, ගුණයකරණකොටගෙණ; ස
ව්සත, සියලුසත්වයන්ගේ; සිත්ගනු, චිත්තග්‍රහණය
කරව; මෙත්නෙත්, මෛත්‍රිය කරණකොටගෙණ;

6 සපදන්විබත් එකබසනම්, තිලොවට උතුම් මුණිසඳුට පුදම්මල්, මිතුරාට සැපදෙව, රුපුහට සිඳුරු නොකියව,—බුහුබසනම්-බමණන්ට දනදෙනු, මහතුන්ට සතුරුනොවව්, සුරනට සතුරුදිත්, නරානට නිගා නොකරව.

7 අවදිවිබත් එකබසනම්, ගසින්ගිලි මිනිසෙක්, දනයෙන් තොරවී මැතිදෙක්, හිරුගෙන් රැස් දිවේ, සඳහුගෙන් සොම්ගුණවේ, බුහුබසනම්, යකුන්ගෙන් උවදුරුවේ, නරන්ගෙන් කැත්ළකට, රුසින්ගෙන් සුව වැඩිවේ, රුක්නගෙන් හුනු වඳුරෝ·

---

වෙර, වෛරය; නසනු, විනාශ කරනු; සිත්නි, චිත්තය කරණකොට ගෙණ; හැමදෙය, සියලුදේ; විමසනු, පරීක්ෂාකරනු.

6 සපදන්විබත් එකබසනම්, සම්ප්‍රදාන විභක්ති එකවචනයනම්; තිලොවට, තුන්ලොවට; උතුම්, උත්තමවූ; මුණිසඳුට, මුණීන්ද්‍රයාට; මල්, පුෂ්පයන්; පුදම්, පූජාකරම්; මිතුරාට, මිත්‍රයාට; සැපදෙව, සුව දානයකරව; රිපුහට, සතුරාට; සිඳුරු, ඡිද්‍රයන්; නොහොත් දොෂ; නොකියව, කථනය නොකරව; බුහුබසනම්, බහුවචනයනම්; බමණන්ට, බ්‍රාහමණයන්ට; දන, දානය; දෙනු, දානයකරනු; මහතුන්ට, මහත්මයන්ට; සතුරුනොවව්, විරුද්ධනොවව්; සුරනට, දෙවියන්ට; දිත්, අසුරයෝ; සතුරු, සතුරෝය; නරානට, මණුෂ්‍යයින්ට; නිගානොකරව, නිග්‍රහ නොකරව.

7 අවදිවිබත් එකබසනම්, අවධිවිභක්ති එකවචනයනම්; ගසින්, වෘක්ෂයෙන්; මිනිසෙක්, මනුෂ්‍යයෙක්; ගිලි, ගලිතවී; දනයෙන්, වස්තුවෙන්; මැතිදෙක්, මන්ත්‍රීන්ද්‍රයෙක්; තොරවී, තුරන්වූයේය

8 සබඳවිබත් එකබසනම්, මවගේසිත පෙමී නාදි,සඳුගේ පිත් සොමිවේ, සොරුගේ සිත න පුරි, රජහුගේපිරිස බලවති, බුහුබසනම්, න රන්ගේදනදනී, ඇතුන්ගේ දිගුදල, රුක්නගේ අතුපතර, තඹරනගේ දලපෙළ·

---

හිරුගෙන්, සූර්‍ය්‍යයාගෙන්; රුස්, රශ්මිය; දිවේ; ධාවනයකෙරේ; සඳහුගෙන්, චන්‍ද්‍රයාගෙන්; සොමිගුණ, සෞම්‍යගුණය; වේ, වෙයි; බුහුබසනම්, බහුවචනයනම්; යකුන්ගෙන්, යක්‍ෂයින්ගෙන්; උවදුරුවේ, උපද්‍රව වෙයි; නරන්ගෙන්, මනුෂ්‍යයන් කෙරෙන්; කැත්, ක්‍ෂත්‍රියතෙම; උකට, උත්කෘෂ්ටයි; රුසින්ගෙන්, ඍෂින්ගෙන්; සුවවැඩිවේ, සුඛාභිවෘද්ධියවේ; රුක්නගෙන්, වෘක්‍ෂයන්ගෙන්; වඳුරෝ, වානරයෝ; නුනු, පතිතවූහ.

8 සබඳවිබත් එකබසනම්, සම්බන්ධවිභක්ති එකවචනයනම්; මවගේ, මාතෘවගේ; සිත, චිත්තය තෙම; පෙමින්, ප්‍රේමයෙන්; අදි, ආද්‍රයි නොහොත් තෙත්වී; සඳුගේ, චන්‍ද්‍රයාගේ; පිත්, පුත්‍රතෙම; සොමිවේ, සෞම්‍යයාවේ; (බුදඹු) සොරුගේ, චෞරයාගේ; සිත, චිත්තයතෙම; නපුරි, නපුරුයි; රජහුගේ; රජයාගේ; පිරිස, පෂිත්තොම; බලවති, බලවත්තයි; බුහුබසනම්, බහු වචනයනම්;–නරන්ගේ; මනුෂ්‍යයන්ගේ; දන, වස්තුව; දනී, දැනගනී; ඇතුන්ගේ, හස්තීන්ගේ; දළ, දළාවෝ; දිගු, දීඝයි; රුක්නගේ, වෘක්‍ෂයන්ගේ; අතු, ශාඛාවෝ; පතර, මහති; තඹරනගේ, තාමරසයන්ගේ; දල පෙළ, පත්‍ර පඞ්ක්තියයි.

9 අදරවිබත් ඒකබසනම්-ලක්දිවැ රජෙක්වී, මෙලකෙහි සතුරු වියවුල්, කොටුවේ වෙඩි ඇසේ, සිතෙහි තදබිය උපදී, බුහුබසනම්-තඹරත්හි මීවේ, මල්වල බිඟුහැසිරෙත්, සතන්හිලාදරවි, සතුරත්කෙරෙහි කහිගුණ, සත් විබත් නිමි.

| | ඒකබස. | බුහුබස. |
|---|---|---|
| 10 පෙර, | සදේ | සදහු |
| අලප්, | සද | සදෙනි |
| කම්, | සදු | සදුන් |
| කතු, | සදහු (විසින්) | සදුන් (විසින්) |
| කරණ | සද(කරණ කොට) | සදුන් (කරණ කොට) |
| සපදන් | සදට | සදනට |
| අවදි | සදෙන් | සදනෙන් |

9 අදරවිබත් ඒකබසනම්, ආධාරවිභක්ති ඒකවචනයනම්; ලක්දිවැ, ලඞ්කාවීපයෙහි; රජෙක් වී; තිරිදෙක් වූයේය; මෙලකෙහි, මේ ලඞ්කාවෙහි; සතුරු වියවුල්, සතුරන්ගේ අවුල්ය; කොටුවේ, කුඩුලයෙහි; වෙඩි ඇසේ, වෙඩිඇසෙයි; සිතෙහි, චිත්තයෙහි; තදබිය, දැඩි භීතිය, උපදී, හටගණීයි; බුහුබසනම්, බහුවචයනම්; තඹරත්හි, තාමරසයන්හී; මී, මධු; වේ, වෙයි; මල්වල, පුෂ්පයන්හී; බිඟු, * භෘඞ්ගයෝ; හැසිරෙත්, සඤ්චාරණය කෙරෙත්; සතන්හී, සන්තානයන්හී; ලා, බහා; දරවි, ධාරණය කරවි; සතුරත් කෙරෙහි, පසමිතුරත් කෙරෙහී; කහිගුණ, කවර ගුණයෙක්ද; සත්විබත්, විභක්ති සප්තකය; නිමි, සමාප්තයි.

* මුල්පොත්හි බිඟුන් කියා තිබේ.

| | ඒකබස | බහුබස |
|---|---|---|
| සබඳ, | සඳුගේ | සඳනගේ |
| අදර | සඳෙ | සඳන්හි |
| පෙර | සුගත * | සුගතහු |
| අලප් | සුගතැ | සුගතෙනි |
| කම් | සුගතා | සුගතුන් |
| කතු | සුගතු | සුගතුන් |
| කරණ | සුගත්(කරණකොට | සුගතුන්(කරණකොට |
| සපදන් | සුගතුට | සුගතුන්ට |
| අවදි | සුගතුගෙන් | සුගතුන්ගෙන් |
| සබඳ | සුගතුගේ | සුගතුන්ගේ |
| අදර | සුගතේ | සුගතන්හි |
| පෙ | වියත † | වියත්හු |
| අ | වියතැ | වියතිනි |
| කම් | වියත | වියතුන් |

**10** සඳේ, චන්ද්‍රතෙම; සඳහු, චන්ද්‍රයෝ; සඳ, චන්ද්‍රය; සඳෙනි, චන්ද්‍රයෙනි; සඳු, චන්ද්‍රයා; සඳුන්, චන්ද්‍රයන්; සඳහුවිසින්, චන්ද්‍රයාවිසින්; සඳුන් විසින්, චන්ද්‍රයන් (විසින්) සඳ, (කරණකොට) චන්ද්‍රයා කරණකොට, සඳුන් කරණකොට; චන්ද්‍රයන් කරණකොට; සඳට, චන්ද්‍රයාට; සඳනට, චන්ද්‍රයන්ට; සඳෙන්, චන්ද්‍රයාකෙරෙන්; සඳනෙනි, චන්ද්‍රයන් කෙරෙන්; සඳුගේ, චන්ද්‍රයාගේ; සඳනගේ, චන්ද්‍රයන්ගේ; සඳෙ, චන්ද්‍රයාකෙරෙහි, සඳන්හි, චන්ද්‍රයන් කෙරෙහි.

සෙසු ශබ්දයන්ටද මෙසේ ප්‍රථමාදි සපතවිභක්තීන්ගේ අර්ථකථනය දැනගත යුතු.

* සර්වඥයන අර්ථයි.

† ව්‍යක්තයා යනුයි.

| | එකවචන. | බහුවචන. |
|---|---|---|
| කා | වියතු | වියතුන් |
| කර | වියතු | වියතුන් |
| ස | වියතහට | වියතුන්ට |
| අ | වියතුගෙන් | වියතුන්ගෙන් |
| ස | වියතුගේ | වියතුන්ගේ |
| අ | වියතේ | වියතුන්හි |
| පෙ | සැඬරුස් * | සැඬරුස්හු |
| අ | සැඬරුස් | සැඬරුස්නි |
| කම් | සැඬරුස් | සැඬරුස්නට |
| කා | සැඬරුස් | සැඬරුස්න |
| කර | සැඬරුස් | සැඬරුස්න |
| ස | සැඬරුස්හට | සැඬරුස්නට |
| අ | සැඬරුස්හුගෙන් | සැඬරුස්නගෙන් |
| ස | සැඬරුස්හුගේ | සැඬරුස්නගේ |
| අ | සැඬරුස් | සැඬරුසන්හි |
| පෙ | සිදුහත් † | සිදුහත් |
| අ | සිදුහත් | සිදුහත් |
| කම් | සිදුහත් | සිදුහත් |
| කා | සිදුහත් | සිදුහත් |
| කර | සිදුහත් | සිදුහත් |
| ස | සිදුහත් | සිදුහත් |
| අ | සිදුහත් | සිදුහත් |
| ස | සිදුහත් | සිදුහත් |
| අ | සිදුහත් | සිදුහත් |
| පෙ | කිවි ‡ | කිවිහු |
| අ | කිවිය | කිවියෙනි |

* සූර්‍ය්‍යයා යන අර්‍ථයි.

† ගෞතමබුදුන් යන අර්‍ථයි.

‡ පණ්ඩිත යන අර්‍ථයි.

| | ඒකවචන. | බහුවචන. |
|---|---|---|
| කර්ම | කිවියා | කිවින් |
| කා | කිවිඳු | කිවින් |
| කර | කිවිඳු | කිවින් |
| ස | කිවියාට | කිවින්ට |
| අ | කිවිඳුගෙන් | කිවින්ගෙන් |
| ස | කිවිඳුගේ | කිවින්ගේ |
| අ | කිවිඳුකෙරෙහි | කිවින්කෙරෙහි |
| පෙර | රිවියා * | රිවිඳු |
| අලප් | රිවියෑ | රිවියෙනි |
| කම් | රිවිය | රිවින් |
| කතෘ | රිවිඳු | රිවින් |
| කරණ | රිවිඳු | රිවින් |
| සපදන් | රිවිහට | රිවින්ට |
| අවදි | රිවිඳුගෙන් | රිවින්ගෙන් |
| සබඳ | රිවියාගේ | රිවියන්ගේ |
| අදර | රිවිඳුකෙරෙහි | රිවින්කෙරෙහි |
| පෙර | පඬි † | පඬුවෝ |
| අ | පඬිය | පඬුවෙනි |
| කම් | පඬියා | පඬුවන් |
| කා | පඬිඳු | පඬුවන් |
| කර | පඬිඳු | පඬුවන් |
| ස | පඬිහට | පඬුවන්ට |
| අ | පඬියාගෙන් | පඬුවන්ගෙන් |
| ස | පඬියාගේ | පඬුවන්ගේ |
| අ | පඬිඳු(කෙරෙයි) | පඬුවන්(කෙරෙහි) |
| පෙ | සකි ‡ | සකියා |
| අ | සකියෑ | සකියෙනි |

* හිරු. † පණ්ඩිත.

‡ මිත්‍ර යන අර්ථයි.

| | ඒකවචන. | බහුවචන. |
|---|---|---|
| කම් | සකිඟු | සකින් |
| කා | සකියා | සකින් |
| කර | සකිඟු | සකින් |
| ස | සකියාට | සකින්ට |
| අ | සකිඟුගෙන් | සකින්ගෙන් |
| ස | සකියාගේ | සකින්ගේ |
| අ | සකියාකෙරෙහි | සකියන්කෙරෙහි |
| පෙ | ගුරු * | ගුරුහු |
| ආ | ගුරුව | ගුරුනි |
| කම් | ගුරු | ගුරන් |
| කා | ගුරුහු | ගුරුන් |
| කර | ගුරුහු | ගුරුන් |
| ස | ගුරුහට | ගුරුන්ට |
| අ | ගුරුගෙන් | ගුරුන්ගෙන් |
| ස | ගුරුගේ | ගුරුන්ගේ |
| අ | ගුරුකෙරෙහි | ගුරුන්කෙරෙහි |
| පෙ | මරු † | මරුවෝ |
| ආ | මරුව | මරුවෙනි |
| කම් | මරුවා | මරුවන් |
| කා | මරුහු | මරුවන් |
| කර | මරුහු | මරුවන් |
| ස | මරුවාට | මරුවන්ට |
| අ | මරුවාගෙන් | මරුවන්ගෙන් |
| ස | මරුවාගේ | මරුවන්ගේ |
| අ | මරුවකෙරෙහි | මරුවන්කෙරෙහි |
| පෙ | මම ‡ | අපි ඇප් |

* ආචාර්‍ය යන අර්‍ථයි.

† මාරයා යන අර්‍ථයි.

‡ අස්මත් යන අර්‍ථයි.

| | එකවචන. | බහුවචන. |
|---|---|---|
| කම් | මා | අප අප් |
| කා | මාවිසින් | අපවිසින් |
| කර | මාකරණකොට | අපකරණකොට |
| ස | මට | අපට අපහට |
| අ | මාගෙන් | අපෙන් අපගෙන් |
| ස | මාගේ | අපේ අපගේ |
| අ | මාකෙරෙහි | අපකෙරෙහි |
| පෙ | තෝ | තෙප් * |
| කම් | තා | තෙපි තොප තො: |
| කා | තාවිසින් | තොපිවිසින් |
| කර | තාකරණකොට | තොපකරණකොට |
| ස | තට තොට | තොපට තෙප්නට |
| අ | තගෙන්- තොගෙන් | තොපෙන්- තොපගෙන් |
| ස | තාගේ තොගේ | තොපේ තොපගේ |
| අ | තාකෙරෙහි- තෝකෙරෙහි | තොපකෙරෙහි- තොපිකෙරෙහි |

සත් විබත් පිළිවෙල නිමි.

**11** අත්කරු තසඳකරු මසඳකරු තෙකල්කිරිය සැකෙවින් පවසමි—එහි අත්කරු අතුකල් එකබස නම්.

---

සත්විබත් පිළිවෙල, සප්තවිභක්තික පටිපාටිය නිමි, නිෂ්ඨායි.

**11** අත්කරු, අන්‍යකාරක; තසඳකරු, තශබ්ද කාරක; මසඳකරු, මශබ්දකාරක සම්බන්ධවූ; තෙ කල් කිරිය, ත්‍රෛකාලික ක්‍රියාව; සැකෙවින්, සංක්ෂෙපයෙන්; පවසමි, ප්‍රකාශකරමි; එහි, ඒ ත්‍රෛකාලිකක්‍රියාවන් අතුරෙහි; අත්කරු, අන්‍යකාරක; අතුකල්එකබසනම්, අතීතකාලික එකවචනයනම්.

---

* තුඹුන් යන අර්ථයි.

දීපංකරමුණි් යමාඉඳුකෙළේ, සව්ලෝද, එ
නරඹා තිවි, මහදෙනේ කෙලෙසුන් වැනසී,
එතන බුදුසිරි සයුරෝරේ කුමුටූ, බුහුබසනම්-
පෙරරුසිහු මයාගත් ගෙනු ගෙනුහු, පෙරපඬි
හු අරුත් පළකළෙෝ, කළුහකළුහු, පෙර නිය
වත්හු උගතනු උගත්හු උගත්හ, මරසෙන් බු
න් බුන්හු බුන්හ.

12 අත්කරු වත්මන්කල් එකබසනම්, දැන්අ
පසැසිහු නවග සසුන් පවනී, දැන් මුළුලෙව්
ඔබ දහමොද බෝ, දැන්ඔබ අරිසඟ තොටු
වන් දෙනේ; දැන් ඒ තුන්රුවන් නියවත් පුද,
බුහුබසනම්.

---

දීපංකර මුණි, දීපඞ්කර සර්වඥ තෙම; යමාඉඳු කෙළේ, යමකසෘඬිය කෙළේසි; සව්ලෝද, සකල ලොකධාතු තෙම; එනරඹා, ඒ යමකසෘඬියබලා; තිවි, තුෂ්ටවූ; මහදෙනේ, මහජනතෙමේ; කෙලෙසුන්, කෙලශයන්; වැනසී, විනාශකෙළේයි; එතන, එ ස්ථානයෙහි; බුදුසිරි, බුඬශ්‍රීනැමති; සයුරෝරේ, සාගරොදරයෙහි; කුමුටූ, ගිලුණේය; බුහුබසනම්, බහුවචනයනම්; පෙරරුසිහු, පූර්ව සෘෂිවරයෝ; මහගත්, මහාග්‍රන්ථයන්; ගෙතූ, ග්‍රන්ථනය කළෝ; ගෙතුහු යනුද මෙමඅර්ථයි පෙරපඬිහු, පූර්වපණ්ඩිතයෝ; අරුත්, අර්ථ, පළකළෙෝ, ප්‍රකාශකළාහුය; කළුහ, කළුහු, කියාදවේ පෙර, පූර්වයෙහි; නියවත්හු, ගුණවන්තයෝ; උගතනු, උද්ග්‍රහනයකළෝ; උගත්හු උගත්හ යනුද මෙමඅර්ථයි; මරසෙන්, මාරසේනාව; බුන්, බිඳුන; බුන්හු බුන්හ යනුද මෙම අර්ථයි.

12 අත්කරු, අන්‍යකාරක; වත්මන්කල්, වර්තමානකාලික; එකබසනම්, එකවචනයනම්; දැන්, මේ

දැත්වත්වත්හු මුණිගුණ වණත්, දැන් ලඇති යෝ විඳිත්, දැන් දනැතියෝ දන්දෙත්, දැන් උඩතුවෝ මෙරබොත්,

13 අත්කරු අනාකල් එකබසනම්, මතු මෙ තේදිනිඳු පස්මරුත්දනත්නේ, එමුණි අපවග අමාදෙත්නේ, ඒ අමාමහදෙනේ බොත්නේ, එළලෙලැ පොසොන් වැසි වස්නේ.

---

කාලයෙහි; අපසැසිහු, අප ශාක්‍යසිංහයාගේ, නව ගසසුන්, නවාඞ්ගශාසනයතෙම; පවති, පවතිසි; දැන්, මේකාලයෙහි; මුලුලෙව්, සකලලොකය තෙම; ඔබදහම්ඔද, උත්වහන්සේගේ; ධර්මාමෘතය; බෝ, පාණයකෙරෙයි; දැන්, මේකාලයෙහි, ඔබ අරිසඟ, උත්වහන්සේගේ; ආර්‍ය්‍යසංඝතෙම; තොා වුවන්, නිර්භීකයන්; දෙනේ, ජයගණී; දැන්, මේ කාලයෙහි; ඒ තුන්රුවන්; ඒරත්නත්‍රය; නියවත්, ශුණවන්තතෙම; පුදැ, පූජාකරයි; බුහුබසනම්, බහු වචනයනම්.

දැන්, මෙකල්හී; වත්වත්හු, මුඛවන්තයෝ; මුණි ගුණ, සර්වඥගුණය; වණත්, වර්ණණාකරත්; දැන්, මෙකලැ; ලඇතියෝ, සිත්ඇත්තෝ; විඳිත්, එය ලබත්; දැන්, මේකාලයෙහි; දනැතියෝ, ධනවන්ත යෝ; දන්, දානය; දෙත්, දානයකරත්; දැන්, මේකා ලයෙනී; උඩතුවෝ, අඥාණයෝ; මෙර, මෙරය බොත්, පාණයකරත්

13 අත්කරු, අන්‍යකාරක; අනාකල්, අනාගත කාලික; එකබසනම්, එකවචනයනම්; මතු, අනා ගතකාලයෙහි; මෙතේදිනිඳු, මෛත්‍රෙය ජිනෙන්ද්‍ර තෙම; පස්මරුන්, පඤ්චමාරයන්; දිනත්නේ; ජයග න්නේය; එමුනි, ඒ සර්වඥතෙම; අපවගඅමා; නිර්වා ණාමෘතය; දෙන්නේ, දානයකරන්නේය.

බුහුබසනම්, මතු මෙතේදිනිඳු පුදන්නෝ,
එසස්නෙහි පැවිදි වන්නාහ වන්නාහු, අන
තිරිය පව්කළහු ඔබ නොදක්නාහු, එසඳ ම
හ දනෝ නිවන් දක්නාහ දක්නාහු.

14 තසඳකරු අයුකල් එකබසනම්, පෙරතෙනා සු
සිරි කෙළෙහි කෙළෙහිය, පෙරතෝ බත්පිසු
යෙහි පිසුයෙහිය, පෙර තෝ මෙළෙහි මෙ
ළෙහිය,පෙර තෝ තුවුවූයෙහි තුවුවූයෙහිය.

---

එඅමා, ඒඅමෘතය; මහදෙනේ මහජනතෙමේ;
බොන්නේ, පානයකරන්නේය; එඋලෙල, ඒ උතුස
වයෙහි; පොසොන්වැසි, මල්වෂාව; වස්නේ, වෂා
කරන්නේය; බුහුබසනම්, බහුවචනයනම්; මතු,
අනාගතයෙහි; මෙතේදිනිඳු, මෛත්‍රෙය සර්වඥයන්
පුදන්නෝ, පූජාකරන්නෝයි; එසස්නෙහි, ඒ ශාස
නයෙහි; පැවිදිවන්නාහ, මහණවන්නාහුය; වන්
නාහුයනුද මෙමඅර්ථයි, අනතිරියපව්, ආනන්තර්‍ය
පාප; කළහු, කළතැනැත්තෝ;ඔබ, උන්වහන්සේ;
නොදක්නාහු, නොදක්නෝයි;එසඳ, ඒකාලයෙහි;
මහදනො, මහජනයෝතුමූ;නිවන්දක්නාහ, නිර්වා
ණය දකින්නාහ; දක්නාහු, යනුද මෙම අර්ථයි·

14 තසඳකරු, තඬබඳකාරක; අයුකල්, අතීතකා
ලික; එකබසනම්, එකවචනයනම්; පෙර, පූර්වයෙ
හි; තෝ සුසිරිකෙළෙහි, තෝ සුචරිත කෙළෙහිය;
කෙළෙහිය යනුද මෙමඅර්ථයි, පෙර, පූර්වයෙහි;
තෝ බත්පිසුයෙහි, තෝ භක්තය පචනය කෙ
ළෙහිය; පිසුයෙහිය යනුද මෙමඅර්ථයි; පෙර, පූර්ව
යෙහි; තෝ මෙළෙහි, තෝ මැරුණෙහිය; මෙළෙ
හිය යනුද මෙමඅර්ථයි; පෙර, පූර්වයෙහි; තෝ තුවු
වූයෙහි, තෝ තුෂ්ටවූයෙහිය; තුවුවූයෙහිය යනුද
මෙම අර්ථයි.

බුහුබසනම්-පෙර තෙපි පින්කළාහු කළාහුය, පෙර තෙපි බත්පිසූවාහු පිසූවාහුය, පෙර තෙපි මළාහ මළහුය, පෙර තෙපි තුටුවූවාහ තුටුවූවාහුය.

**15** තසදකරු වත්මන් කල් එකබසනම්, දැන් තෝ සුසිරි කෙරෙහි, දැන් තෝ බත්පිසෙහි, දැන් තෝ මැරෙහි, දැන් තෝ තුටුවෙහි.

---

බුහුබසනම්, බහුවචනය නම්; පෙර, පූර්වයෙහි; තෙපි පින්කළාහු, තොපි කුසල්කළාහුය; කළාහුය යනුදු මෙම අර්ථයි; පෙර, පූර්වයෙහි; තෙපි, තොපි නුඹ; බත්පිසූවාහු, භක්තය පචනයකළාහුය; පිසූවාහුය යනුදු මෙම අර්ථයි; පෙර, පූර්වයෙහි; තෙපි, තොපිනුඹ; මළාහ, මැරුණාහුය; මළාහුය යනුදු මෙම අර්ථයි; පෙර, පූර්වයෙහි; තෙපි තුටුවූවාහුය, තොපි සන්තුෂ්ටවූවාහුය; තුටුවූවාහුය යනුද මෙම අර්ථයි.

**15** තසදකරු, තශබ්දකාරක; වත්මන්කල්, වර්තමානකාලික; එකබසනම්, එකවචනයනම්; දැන්, මේකාලයෙහි; තෝ සුසිරිකෙරෙහි, තෝ සුචරිතය කෙරෙහිය; දැන්, මේකායෙහි; තෝ බත්පිසෙහි, තෝ භක්තය පචනය කෙරෙහි; දැන්, මේකාලයෙහි; තෝ මැරෙහි, තෝ මැරෙහිය; දැන්, මේකාලයෙහි; තෝ තුටුවෙහි, තෝ සන්තොෂවෙහිය; බුහුබසනම්, බහුවචනයනම්; තොපි, තෙපි නුඹ; පින්කරන්නව, කුසල්කරන්නාහු; කරව්, කරපියව්; දැන්, මේකාලයෙහි; තොපි, තෙපිනුඹ; බත්, භක්තය; පිසන්නාව, පචනයකරන්නහු; පිසව්, උයාපියව්; දැන්, මේකාලයෙහි; තොපි, තෙපිනුඹ; මැරෙනනාව, මැරෙන්නහු; මැරෙව් මැරෙව්; දැන්, මේකාලයෙහි; තොපි, තෙපිනුඹ; තුටුවන්නව, සන්තොෂවන්නහු, තුටුවව් යනුද මෙම අර්ථයි.

16 තසඳකරු අනාකල් එකබසනම්, මතු තෝ සෙත්පුර අත්පත් කරන්නෙහි, මතු තෝ දිව සුව ලබන්නෙහි මතු තෝ රජවන්නෙහි, මතු තෝ ජයගන්නෙහි, බුහුබස නම්, මතු තෙපි සෙත්පුර අත්පත් කරන්නාහු, මතු තොපි දිව සුව ලබන්නාහු, මතු තොපි රජවන්නාහු, මතු තොපි ජයගන්නාහු.

17 මසඳකරු අයුකල් එක බසනම්, පෙර මම පින්කෙළෙම් කෙළෙම් කෙළෙම්ලූ, පෙර මම බත්පිසීමි පිසූයෙම් පිසූයෙම්ලූ, පෙර මම රජ වීමි රජවූයෙම්ලූ, පෙර මම ජයගතිමි ජයගතිම් ජය ගතිම්ලූ.

---

16 තසඳකරු, තශබ්දකාරක; අනාකල්, අනාගත කාලික; එකබසනම්, එකවචනයනම්; මතු, අනාගතයෙහි; තෝ, නුඹතෙම; සෙත්පුර; ශාන්තිපුරය; අත්පත්කරන්නෙහි, හස්තප්‍රාප්ත කරන්නෙහි; මතු, අනාගතයෙහි; තෝ, නුඹතෙම; දිවසුව, දිව්‍යසැපය; ලබන්නෙහි, ලැබීම කරන්නෙහි; මතු, අනාගතයෙහි; තෝ රජවන්නෙහි, තෝ නරේන්ද්‍රවන්නෙහිය; මතු, අනාගතයෙහි; තෝ ජය ගන්නෙහි, තෝ දිනීමගන්නෙහිය; බුහුබසනම්, බහු වචනය නම්; මතු, අනාගත යෙහි; තෙපි, යුෂ්මත්හු; සෙත්පුර, ශාන්තිපුරය; අත්පත් කරන්නාහු, හස්තප්‍රාප්ත කරන්නාහු; මතු, අනාගතයෙහි; තොපි, යුෂ්මත්හු; දිව්‍යසුව, දිව්‍යසැප; ලබන්නාහු, විඳින්නාහු; මතු, අනාගතයෙහි; තොපි, යුෂ්මත්හු; රජවන්නාහු, රාජවන්නාහු; මතු, අනාගතයෙහි; තොපි යුෂ්මත්හු; ජයගන්නාහු, ජය ග්‍රහණයකරන්නාහුය.

17 මසඳකරු, මශබ්දකාරක; අයුකල්, අතීතකාලික; එකබසනම්, එකවචනයනම්; පෙර, පූර්වයෙහි;

බහුබස නම්, පෙර අපි පින් කළමු කළමො කළමුළු පෙර අපි බත්පිසමෝ පිසූමු පිසූමුළු, පෙර අපි රජවූමු රජවීමු රජවීමුළු, පෙර අපි ජයගතිමු ජයගතුමෝ ජයගතුමුළු.

18 මසඳකරු වත්මන් කල් එකබසනම්, මම දැන් පින් කෙරෙමි කෙරෙම්, මම දැන් බත් පිසෙමි, පිසෙම්, මම දැන් ජයගණ්මි ගණ්ම්.

---

මම පින්කෙළෙම්, මම් කුසල්කෙළෙමි; කෙළෙමි, යනුද මෙමඅර්ථයි; කෙළෙම්ලූ, කෙළෙමිලූ; පෙර, පූර්වයෙහි; මම බත්පිසීමි, මම් භක්තය පචනය කෙළෙමි, පිසූයෙම් යනුදු මෙමඅර්ථයි; පිසූයෙම්ලූ, පචනය කෙළෙම්ලූ; පෙර, පූර්වයෙහි; මම රජවීමි, මම් රජවූයෙමි; රජවූයෙම්ලූ, රජවීම්ලූ; පෙර, පූර්වයෙහි, මම ජයගතිමි, මම් ජයග්‍රහණ කෙළෙම්; ජයගතිම්, යනුද මෙමඅර්ථයි; ජයගතිම්ලූ, ජයග්‍රහණය කෙළෙම්ලූ.

බහුබසනම්, බහුවචනය නම්; පෙර, පූර්වයෙහි; අපි, අපමත්තු; පින්කළමු, කුසල කෙළෙමු; කළමෝයනුද මෙමඅර්ථයි; කළමුළු, කෙළෙමුළු; පෙර, පූර්වයෙහි; අපි, අපිතුමු; බත්පිසමෝ, භක්තය පචනයකෙළෙමු; පිසූමු යනුදු මෙමඅර්ථයි; පිසූමුළු, පචනය කෙළෙමුළු; පෙර, පූර්වයෙහි; අපි, අපමත්තු; රජවූමු, රජවූයෙමු; රජවීමු යනුද මෙම අර්ථයි; රජවීමුළු, රජවූනෙමුළු; පෙර, පූර්වයෙහි; අපිජයගතිමු, අපි ජයග්‍රහණය කෙළෙමු; ජයගතුමෝ යනුද මෙමඅර්ථයි, ජයගතුමුළු, ජයග්‍රහණය කෙළෙමුළු.

18 මසඳකරු, මශබ්දකාරක; වත්මන්කල්, වර්තමානකාලිත; එකබසනම්, එකවචනය නම්; මම දැන්, මම් මේකාලයෙහි; පින්කෙරෙමි, කුසල්කරම්,

බහුබසනම්, අපි දැන් පින්කරමු, අපි දැන් බත් පිසමු, අපි දැන් රජවෙමු, අපි දැන් ජයගණිමු.

19 මසදකරු අනාකල් එකබසනම්, මතු මම රහත්වන්නෙමි, මතු මම නිවන්දක්නෙමි, මතු මම ගුණදම් පුරන්නෙමි බහුබසනම් මතු අපි රහත් වන්නෙමු.

---

කෙරෙම් යනුද මෙම අර්ථයි; දැන් මේ කාලයෙහි මම බත්පිසෙමි, මම් බත්උයම්; පිසෙම් යනුද මෙම අර්ථයි; දැන්, මේ කාලයෙහි; මමජයගණිම්, මම් ජයග්‍රහණය කරම්; ගණිම් යනුද මෙමඅර්ථයි.

බහුබසනම්, බහු වචනය නම්; අපි, අයමත්හු, දැන්, මේකාලයෙහි; පින්කරමු, කුසල්කරමෝ, දැන්, මේකාලයෙහි, අපි බත්පිසමු, අපි බත්උයමු; දැන්, මේකාලයෙහි; අපි රජවෙමු, අපි පෘථිවිපාලවෙමු; දැන්, මේකාලයෙහි; අපි ජයගණිමු, අපි ජයග්‍රහණය කරමු.

19 මසදකරු, මශබ්දකාරක; අනාකල්, අනාගත කාලික; එකබසනම්, එකවචනයනම්; මතු, අනාගතයෙහි; මම රහත්වන්නෙමි, මම් අර්හත්වන්නෙමි; මතු, අනාගතයෙහි; මම නිවන්දක්නෙමි, මම නිර්වාණය දකින්නෙමි; මතු, අනාගතයෙහි; මම ගුණදම් පුරන්නෙමි, මම් ගුණධර්ම පූරණය කරන්නෙමි; බහුබසනම්, බහුවචනයනම්; මතු, අනාගතයෙහි; අපි, අසමත්හු, රහත් වන්නෙමු, අර්හත් වන්නෙමු.

මතු අපි නිවන්දක්නෙමු, මතු අපි ජයගත් නෙමු, මතු අපි ගුණදම් පුරන්නෙමු.

ඉති තෙකල් කිරිය නිමි.

20 විදිකිරියනම්, බමණ පනද, බොජ, මහබා සැරදේ, මේකරු මේ පිසන්නේ, හිමිනුබ දහම් දෙසන්නේ, ගුණකැත් නම් මෙහි බජව්, සජනෙනි යහක්දකකු.

21 ආසිකිරිය නම් සරසවිය මා මුවනඹරෙහි ඉස්බෙව්වා, නරපවර වැජඹෙව්වා, දියහිය කිරිමෙහි වත්වෙම්වා, හිමිසඳ කප්නිම් දිනෙව්වා, අග

---

මතු, අනාගතයෙහි; අපිනිවන්දක්නෙමු, අපිනිර්වාණය දර්ශනය කරන්නෙමු; මතු, අනාගතයෙහි; අපි, අස්මත්හු; ජයගන්නෙමු, ජයග්‍රහණය කරන්නෙමු; මතු, අනාගතයෙහි; අපි, අස්මත්හු; ගුණදම්, ගුණධර්මය; පුරන්නෙමු, පූරණය කරන්නෙමු;

ඉති, මෙසේ; තෙකල්කිරිය, ත්‍රෛකාලික ක්‍රියාව; නිමි, සමාප්තයි.

20 විදිකිරිය නම්, විධාන ක්‍රියාවනම්; බමණ, බ්‍රාහ්මණය; පනද, දෙවෙනි දවස්හි; බොජ, අනුභව කරව; මහබා, මහාබාහුවනානය; සැරදේ, චිරකාලයක් ජීවත්වෙව්වා; මේකරු, මෙහෙකරුතෙම; මේ, භක්තය; පිසන්නේ, පචනය කරන්නේය; හිමි, ස්වාමිනි; නුබ, නුබවහන්සේ; දහම්, ධර්මය, දෙන්නේ, දෙසනාකරන්නේ; ගුණකැත් නම්, ගුණයක් ඇත්නම්; මෙහිබජව්, මෙහි භජනයකරව්; සජනෙනි, සත්පුරුෂයෙනි; යහක්දකකු, යහසතක් දර්ශනය කරව්.

මැනිඳු බෝකලක් පවතීවා, බුදුසසුන් පස්වා දහස්කල් දිනේවා, ඔබදහම් සුගතනිම් බැබලේවා.

22 පෙරකිරියනම් බවනැව්තරා යහවිදිත්, පෙරුම්පුරා බුදුවූ, පවිටූ කොබගොසින් රුකේ, දිටුමඟුල් මතඟු දූකලා නැවැත්, කරණී පිරිස් සාලාකරණු, බමර පොසොන්පතර මී බීලායේ, සගයහ ගෙසින්ලානහමව්, සුරඳුරෙත් අවුත් මිනිස්ලොව උපනි.

---

21 ආසිකිරියනම්, ආශිර්වාද ක්‍රියාවනම්; සරසවිය, සරස්වතීතොම; මා මුවතඹරෙහි, මාගේ මුඛතාමරසයෙහි; ඉස්බේවා, විශ්‍රාමය කෙරේවා නොහොත් ගිමන්හිරීවා; නරපවර, නරොත්තමය; වැජඹේවා, ලීලොපෙත වේවා; දිය, ලොකයට, හියකිරීමෙහි, හිතකිරීමෙහි; වත්වෙම්වා, සමෘද්ධවෙම්වා; හිමිසඳ, ස්වාමීන්ද්‍රය; කප්නිම්, කල්පසීමාව දක්වා; දිනේවා, ජයගණීවා; අගමැතිඳු, අග්‍රමන්ත්‍රීන්ද්‍රතෙම; බෝකලක්, බොහෝකාලයක්; පවතීවා, ප්‍රවර්තනය වේවා; බුදුසසුන්, බුද්ධශාසනය; පස්වාදහස් කල්, අවුරුදුපන්දහස් කාලයක්; දිලේවා, දිලිසේවා; ඔබදහම්, උන්වහන්සේගේ ධර්මය; සුගතනිම්, කප්කෙළවරඉම්කොට; බැබලේවා, භ්‍රාජිතවේවා.

22 පෙරකිරියනම්, පූර්වක්‍රියාවනම්; බවණැව්තරා; භවාර්ණවය තරණයකොට; යහවිදිත්, සුඛානුභව කෙරෙත්; පෙරුම්පුරා, පාරමී පූරණයකොට; බුදුවූ, බුද්ධවූයේය; පවිටූ, පාපිෂ්ඨතෙමේ; කොබගොසින්, කොතැන්හි ගමණයකොට; රුකේ, රක්ෂවේද; දිටුමඟුල්; දෘෂ්ටමඞ්ගලිකාතොම; මතඟු, මාතඞ්ගපණ්ඩිතයන්; දූකලා, දූෂිතයකරලා; නැවැත්,

**23** මුසුකිරියනම්, මරසක් තනමින් පැලා, නටමින් සරති, කමින්යේ, ලියමින් ඇවිදි, මුණිරිවි උදාදෙන තිතුළුකැත් මිලියෙමිනි අතුරු දහන් බිජී.

**24** පියඳු කිරියනම්, සුදෙට මෙහෙකරු ලවා බත්පිසවා, මහරජ ඇමති ලවා සුදකරවා, ඇඳුරු අතවැසි ලවා සිප් ගදුරවා, අගවිප්

---

නැවතුනී; කරණී, කටයුතු; පිරික්සාලා කරණු; පරීක්ෂාකරලා කරණු; බමර, භෘඞ්ගතෙම; පොසොත්පතර, මල්පෙතිවල; ෆී බීලායේ, මධුපානය කරලා යෙයි; සගයහ, සවගීසැපය; ගොසින්ලා ගමණයකරලා; නහමව්, බලව්; සුරපුරෙන්, දිව්‍ය පුරයෙන්; අවුත්, ඇවිදින්; මිනිස්ලොව, මනුෂ්‍ය ලොකයෙහි; උපනී, උපන්නේයි.

**23** මුසුකිරියනම්, මිශ්‍රක්‍රියාවනම්; මරසක්, මාර සෙනාතොමෝ; තනමින්, කම්පාවෙමින්; පැලා, පලාගියේය; නටමින්, නෘත්‍ය කරමින්; සරති, හැසිරෙති; කමින්, අනුභවකරමින්; යේ, යයි; ලියමින්, ලේඛණය කරමින්; ඇවිදි, ගමන්කරයි; මුණිරිවි, සර්වඥසූර්‍ය්‍යා; උදාදෙන, උදිතවූකල්හී; තිත්ළුව්කැත්, තීර්ථකනැමති තාරකාසමූහය, මිලියෙමිනී, මලානිකවෙමින්; අතුරුදහන්, අන්තර්ධානය; බිජී, භජනය කෙළේය.

**24** පියඳුකිරියනම්, ප්‍රයොජ්‍ය ක්‍රියාවනම්; සුදෙට, සූපජ්‍යෙෂ්ඨතෙම; මෙහෙකරුලවා, අතවැස්සාලවා; බත්පිසවා, භක්තය පචනයකරවා; මහරජ, මහරජ, මහරජතෙම; අමතිලවා, අමාත්‍යයන් ලවා; සූදකරවා, සූඞකරවයි; ඇඳුරු, ආචාර්‍ය්‍යතෙම; අතවැසිලවා, අන්තෙවාසිකයාලවා; සිප් ගදුරවා, සිල්පසජ්ඣායනය කරවා; අගවිප්, අගබමුණුතෙම;

අඳුන්ලවා යාග කරවා, රාසොඬුම් මිතුරන් ලවා දූකෙළුවා, ඉති සැකවින් තෙකල්හිරිය ඇ කිරිය වෙසෙස් නිමි.

---

අඳුන්ලවා, බ්‍රාහමණයන් ලවා; යාගකරවා, යඥ කරවා; රාසොඬුම්, සුරලොල් තැනැත්තෝ; මිතු රන් ලවා, මිත්‍රයින්ලවා; දූකෙළුවා, සූදුකෙළුවා;— ඉති, මෙසේ; සැකෙවින්, සංක්‍ෂෙපයෙන්; තෙකල් කිරිය ඇ, ත්‍රෛකාලික ක්‍රියාදිවූ; කිරියවෙසෙස්, ක්‍රියාවිශෙෂ; නිමි, සමාප්තයි.

නි මි.

B. S.